## සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - සති පාසල

**1. ශ්‍රේණිය** :-11 ශ්‍රේණිය **විෂය** :- : පෙරදිග සංගීතය **අදාළ සතිය** නොවැම්බර් 1වන සතිය

**2.පාඩම/ ඒකකය:-**. 6.1 රේඛාව චිත්‍රපටයේ සංගීතය හා තෝරා ගත් ගීත

**3. ශිෂ්‍යයා කළ යුතු කාර්යයන්:-**

- සිංහල චිත්‍රපට ඉතිහාසයේ සිංහල සලකුණ සටහන් ප්‍රථම සිංහල චිත්‍රපටය වීම.
- සුනිල් සාන්තයන්ගේ නිර්මාණ කෞශල්‍ය විදහා දක්වන සරල හා දේශීයත්වයට නැඹුරු වූ සංගීතයෙන් පෝෂණය වීම.

❖ ඔබ උගත් පාඩම ඇසුරින් පහත සඳහන් ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

1. රේඛාව චිත්‍රපටයේ ඔබ කැමති එක් ගීතයක කොටසක් ලියා දක්වන්න.
2. ඉහත පාඩම ඇසුරින් පහත වගුව සම්පූර්ණ කරන්න.

| චිත්‍රපටයේ නම | රේඛාව |
|---|---|
| තිරගතවූ වර්ෂය | |
| චිත්‍රපට අධ්‍යක්ෂණය | |
| සංගීත අධ්‍යක්ෂණය | |
| ගී පද රචනය | |
| ගී තනු නිර්මාණය | |
| ගායක ගායිකාවෝ | |
| ඇතුලත් වූ ගීත | |
| ගී තනුවල ස්වභාවය | |
| | |

රේඛාව චිත්‍රපටයේ සංගීතමය තොරතුරු

ශ්‍රී ලංකාවේ චිත්‍රපට කලාව ආරම්භ වන්නේ 1947 වර්ෂයේදී ය. ශ්‍රී ලංකාවේ මුල්ම චිත්‍රපටය කඩවුන පොරොන්දුව නම් චිත්‍රපටයයි. එහෙත්, ශ්‍රී ලංකාවේ 1947 න් පසු මුල්ම යුගයේ බිහිවූ චිත්‍රපට බොහොමයක් ද්‍රවිඩ ආභාසය ලබා ඇති අතර මුල් දශකයේ අග භාගයේ ස්වාධීන තනු හා පසුබිම් සංගීතය රැගත් මුල්ම සිංහල චිත්‍රපටය රේඛාව චිත්‍රපටයයි.

රේඛාව චිත්‍රපටයේ දැකිය හැකි විශේෂ ලක්ෂණ -

- තිරගතවූ වර්ෂය - 1956
- චිත්‍රපට අධ්‍යක්ෂණය - බී.එස්. පෙරේරා.
- සංගීත අධ්‍යක්ෂණය - ලෙස්ටර් ජේම්ස් පීරිස්.
- ගී පද රචනය - මර්සලින් ජයකොඩි පියතුමා.
- ගී තනු නිර්මාණය -සුනිල් සාන්ත.
- ගායක ගායිකාවෝ - සිසිර සේනාරත්න, ඉන්ද්‍රානි විජේබණ්ඩාර, අයිවෝ ඩෙනිස්, ලතා වල්පොල. තිලකසිරි ප්‍රනාන්දු,
- ඇතුලත් වූ ගීත - ඕලු නෙළුම්, සුදු සඳ එලියේ, වෙසක් කැකුළු, අනුරාධපුර පොලොන්නරුව, මිණිමුතු පයට, සීගිරි ලඳකගෙ
- ද්‍රවිඩ ආභාෂයට වඩා වෙනස් මුහුණුවරකින් ගීත ලියවී තිබීම
- ගී පද සරල වීම
- ගීතනු සරල වීම
- ශුද්ධ ස්වර ඇසුරු කොට ගී තනු නිර්මාණය වී තිබීම.
- භාරත ගී තනු අනුකරණයෙන් බැහැරව ස්වතන්ත්‍ර ගී තනු හා පසුබිම් සංගීතය යොදාගෙන තිබීම.
- විරිදු පන්තියක් ඇතුලත් වීම.

**4.ඉහත ක්‍රියාකාරකම සඳහා උපකාර කර ගත හැකි ඉගෙනුම් ආධාරක**

- e - නැණ පියස:- 11 ශ්‍රේණිය
- 11 ශ්‍රේණිය පෙරදිග සංගීතය අතිරේක කියවීම් පොත
- You tube නාලිකා :- https://www.youtube.com/watch?v=qKWR3sdDJGY
  https://www.youtube.com/watch?v=v7F4mY6nLjI

**5.අපේක්ෂිත ඉගෙනුම් ඵල:-**

- රේඛාව චිත්‍රපටයේ සංගීතය පිළිබඳ විස්තර කරයි.
- රේඛාව චිත්‍රපටයේ ගීත නම් කරයි.
- රේඛාව චිත්‍රපටයේ ගීත ගයයි.

**සැකසුම:-** කෑගල්ල අධ්‍යාපන කලාපය